කොවිඩ් ව්‍යාප්තිය



දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

දේශයේ පාලන මාවත
අද පත්‍රය සමග

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ වප් අව සැටවක ලත් කිවි දින | කාණ්ඩය 111 | පත්‍රය 277 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 06 සිකුරාදා



ඇඳිරි නීතිය ඉවත් කළත් නිරෝධායන ක්‍රියාවලිය නිරීක්ෂණය කරන්න

ජනපති නිලධාරීන්ට උපදෙස් දෙයි

ධනුෂ්ක ගොඩකුඹුර

කොවිඩ් මර්දනය සඳහා ක්‍රියාත්මක ස්වයං නිරෝධායන ක්‍රියාවලිය ඇඳිරි නීතිය ඉවත් කිරීමෙන් පසුවද දැඩිව නිරීක්ෂණය කරන ලෙස කොවිඩ් මර්දන කාර්ය සාධන බළකායේ දෛනික හමුවට ජනාධිපති කාර්යාලයේදී ඊයේ (05) එක් වෙමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

කොවිඩ් ආසාදිතයන් ආශ්‍රිත බව හඳුනා ගත් සියලු පවුල් සිය නිවෙස්වලම ස්වයං නිරෝධායනයට යොමු කරන ලද අතර රට පුරා නිවාස 31,457ක 84,000කට ආසන්න පිරිසක් එසේ නිරෝධායනය වෙමින් සිටිති. බස්නාහිර පළාතේ නිවාස 13,911ක 40,676 දෙනෙක් නිරෝධායනය වෙති.

නිරෝධායනය වෙමින් සිටින පිරිස ඇඳිරි නීතිය ඉවත් කළ පසුවද විධිමත්ව අධීක්ෂණය කළ යුතු බව රාජපක්ෂ මහතා අවධාරණය කළේය. පිට 06

බස්නාහිර පළාත සඳුදා විවෘත කළ හැකියි

යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා

සුභාෂිණී සේනානායක

නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක බස්නාහිර පළාත ලබන සඳුදා (09) වන විට විවෘත කළ හැකි බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා විශ්වාසය පළ කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත සිදු කළ කොවිඩ් මර්දන ක්‍රියාවලිය සාර්ථක පිටිවහක පවතින බව කියා සිටි යුද හමුදාපතිවරයා බොහෝ දුරට බස්නාහිර පළාත විවෘත කළ හැකි වන බවත් පෙන්වා දෙයි. පිට 06

මිනුවන්ගොඩ කොරෝනා පොකුර ගැන පරීක්ෂණයට පත් කළ නිලධාරීන්ගේ තොරතුරු දෙන්න

නීතිපති වැඩබලන පොලිස්පතිට කියයි

සුදර්ශ හෙට්ටිආරච්චි

මිනුවන්ගොඩ කොරෝනා පොකුරේ වයිරස් ව්‍යාප්තිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට පත් කළ විමර්ශන නිලධාරීන් පිළිබඳ තොරතුරු තමාවෙත වහා දන්වන්නැයි නීතිපති දප්පුල ද ලිවේරා මහතා වැඩබලන පොලිස්පතිවරයාට ඊයේ (05) උපදෙස් දුන්නේය. පිට 06



කොවිඩ් ප්‍රවාහන ප්‍රතිපත්තිය ලබන සතියේ

නිහාල් රාජපක්ෂ

කොවිඩ් ප්‍රවාහන ප්‍රතිපත්තිය ලබන සතිය වන විට එළිදැක්වීමට රජය සූදානම් වේ. පිට 06

වැලිකඩ - කොළඹ බන්ධනාගාරවලින් ආසාදිතයෝ 9ක්

පිට 06

PCR කළ රෝගියා බොරු තොරතුරු දීලා

පිට 06

පොලීසියේ 275කට කොරෝනා

පිට 06

ඔස්ට්‍රේලියාවේ සිට පැමිණ දින 28ක් නිරෝධායනය වූ කාන්තාවකට

වසංගතය ආණ්ඩුව වසන්තයක් කර ගෙන

නිරංජනී ප්‍රනාන්දු

කොවිඩ් වසංගතය ආණ්ඩුව වසන්තයක් කරගෙන කටයුතු කරන බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා ඊයේ (05) පැවසීය. පිට 06

අධ්‍යාපනය හැදෑරූ

ශ්‍රී ලාංකිකයාට ත්‍රස්තවාදී චෝදනා නැඟූ ඔස්ට්‍රේලියානු ජාතික කවාජාට සිර දඬුවම්

මහින්ද අලුත්ගෙදර

ඔස්ට්‍රේලියාවේ ආචාර්ය උපාධිය හදාරමින් සිටි ශ්‍රී ලාංකිකයකු ත්‍රස්තවාදියකු යැයි හඳුන්වමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කළ බවට චෝදනා එල්ල වී සිටි ඔස්ට්‍රේලියානු ක්‍රිකට් ක්‍රීඩක උස්මාන් කවාජාගේ සොහොයුරු අර්සලාන් කවාජාට එරට අධිකරණයක් මගින් වසර හතර හමාරක සිර දඬුවමක් නියම කර තිබේ. පිට 06

නාය යන අඩි අවදානම් තැනක හෝටලයක් හදන්න ඩෝසර් කරලා

පිට 06

කොවිඩ් වැඩිම මරණ සහ සුව වූවන් ඊයේ

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් 19 වයිරසය ආසාදිත වූවන්ගෙන් වැඩිම පිරිස ලෙස 765ක් එක් දිනකදී පූර්ණ සුවය ලබා පිටව යද්දී එක් දිනකදී වැඩිම කොවිඩ් මරණ ගණන ද ඊයේ (05) දිනයේ වාර්තා විය. පිට 06

කූට සහල් වෙළෙඳුන් අල්ලන්න වැටලීම්

පිට 06

ජෝ බයිඩන් ඉදිරියෙන්



මහින්ද අලුත්ගෙදර

ඇමෙරිකානු ජනාධිපතිවරණ ඉතිහාසයේ අපේක්ෂකයෙකු ලැබූ ඉහළම ඡන්ද ප්‍රතිශතය ලබාගනිමින් ඩිමොක්‍රටික් ජනාධිපතිධූර අපේක්ෂක ජෝ බයිඩන් මහතා මෙතෙක් ප්‍රකාශිත ප්‍රතිඵලවලට අනුව ඉදිරියෙන් සිටී. පිට 06

හොර හරක් ලොරිය හඹා ගිය

රථය ඔරලෝසු කණුවේ ගැටී

ආණමඩුව ට්‍රැෆික් OIC මරුට

පිට 06

ආදායම් වාර්තා ගොනු කිරීමට සහන කාලයක්

පසන් විජේසේකර

කොවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් දැනට රට තුළ පවතින